**ජාතික තරුණ සේවා සභාව**

-------------------------------

1. **ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම**

---------------------------------------------

ජාතික තරුණ සේවා සභාව සතුව සී/ස තරුණ සේවා සමාගම , සී/ස තරුණ සේවා (සංගීත) සමාගම හා සී/ස තරුණ සේවා (නැටුම්) සමාගම වශයෙන් වූ පරිපාලිත සමාගම් තුනක් පැවතිය ද එම සමාගම්වල මූල්‍ය ප්‍රකාශන සමඟ සභාවේ ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර නොතිබුණි.

2 **මූල්‍ය ප්‍රකාශන**

---------------

2.1 **මතය**

--------

මෙම වාර්තාවේ ඇතුලත් අදහස් දැක්වීම් සහ නිරීක්ෂණයන් හේතුකොට ගෙන විගණනය සඳහා ඉදිරිපත් කර ඇති ජාතික තරුණ සේවා සභාවේ 2010 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන පිළිබඳ මතයක් ප්‍රකාශ කිරීමට මට නොහැකිය.

2.2 **මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම**

----------------------------------------

2.2.1 ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත

-------------------------------

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත අංක 03 ප්‍රකාර සමාලෝචිත වර්ෂයේ දත්තයන් හතරක් ඉකුත් වර්ෂයේ දත්තයන් සමඟ සංසන්දනාත්මකව පැහැදිලි ලෙස මූල්‍ය ප්‍රකාශන මගින් ඉදිරිපත් කර නො තිබුණි.

(ආ) ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත අංක 22 හා 26 ප්‍රකාර ආයෝජන අගය කිරීමක් සිදු කර අදාල වෙනස්කම් සම්බන්ධයෙන් ගිණුම්වලට ගැලපීමක් සිදු කළ යුතු වුව ද , 1982 වර්ෂයේ සිට සභාවේ පරිපාලිත සමාගම් 03 ක කර තිබුණු රු. 4,032,360 ක් වූ ආයෝජන අගය කිරීමකින් තොර ව ඒවා පිරිවැය අගයට මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණි.

(ඇ) ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත අංක 24 ප්‍රකාර , රජයේ ප්‍රාග්ධන ප්‍රදාන මගින් මිලදී ගන්නා වත්කම් වල ක්ෂය වීමේ වටිනාකම අදාල ප්‍රාග්ධන ප්‍රදාන ගිණුමට වාර්ෂිකව ගැලපීම් කළ යුතු වුවත් රජයෙන් ප්‍රාග්ධන ප්‍රදාන ලෙස සභාව වෙත ලද රු. 1,164,685,059 ක් ඒ අනුව ගිණුම් ගත කර නො තිබුණු අතර ලද ප්‍රාග්ධන ප්‍රදාන නිශ්චිතව ස්ථාවර වත්කම් මිලදී ගැනීම සඳහා යෙදවූවේද යන්න විගණනයේදී තහවුරු කරගත නොහැකි විය.

### 2.2.2 ගිණුම්කරණ අඩුපාඩු

--------------------------

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ

(අ) වර්ෂයක ට වැඩි ජීව කාලයක් සහිත , ගොවිපොළ තුල රඳවා ගෙන තිබුණු සහ විකුණා ආදායම් ඉපයීම අරමුණු කර නො ගත් රු. 608,000 ක පශු සම්පත් තොගයක් ස්ථාවර වත්කම් යටතේ දැක්විය යුතු වුවත් වෙළඳ තොගයක් ලෙස දක්වා තිබණෙන්, සමාලෝචිත වර්ෂයේ ගොවිපොළ කාරක ගිණුමේ ලාභය රු. 608,000 කින් වැඩියෙන් දක්වා තිබුණි.

(ආ) තරුණ සංවර්ධනය යටතේ වූ වියදම් විෂයයන් 02 ක් සඳහා ඉදිරිපත් කර තිබුණු උපලේඛන අනුව එකතුව හා ආදායම් වියදම් ගිණුමේ පෙන්වා ඇති එම විෂයයන් දෙකෙ හි එකතුව අතර රු. 2,199,211 ක වෙනසක් විය.

### 2.2.3 ලැබිය යුතු ගිණුම්

--------------------

වර්ෂ 05 කට වඩා පැරණි රු.7,750,879 ක ණය ශේෂ 144 ක් පැවැති අතර ඒ තුල වර්ෂ 10 ක් ඉක්ම වූ ණය ශේෂ රු. 1,403,447 ක් ද , වර්ෂ 15 ක් ඉක්ම ව ණය ශේෂ රු. 2,243,401 ක් ද විය.

### 2.2.4 විගණනය සඳහා සාක්ෂි නොවීම

----------------------------------

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ

එකතුව රු.43,820,015 ක් වූ ගිණුම් විෂයයන් 07 ක් සම්බන්ධයෙන් අදාල සාක්ෂි විගණනයට ඉදිරිපත් නොවීම හේතුවෙන් ඒවා විගණනයේ දී සතුටුදායක ලෙස සන්නිරීක්ෂණය කිරීමට හෝ පිළිගැනීමට නොහැකි විය. විස්තර පහත දැක්වේ.

| විෂයය | වටිනාකම | ඉදිරිපත් නොවූ සාක්ෂි |
|---|---|---|
| -------- | ----------- | ----------------------- |
| | රු. | |
| විදේශ ආයතන 08 කින් 2007 වර්ෂය ට පෙර ලද පුනරාවර්තන සංවර්ධන ලැබීම් | 4,382,679 | ගිවිසුම් ඇතුළු අදාල ලියකියවිලි |
| පළාත් සභා පුනරාවර්තන ලැබීම් | 553,823 | ලිපිගොනු විස්තර |
| විමධ්‍යගත ප්‍රාග්ධන ලැබීම් | 93,153 | අදාල ලියකියවිලි |
| විදේශ සංවර්ධන ප්‍රාග්ධන ලැබීම් | 1,787,683 | ගිවිසුම් ඇතුළු අදාල ලියකියවිලි |
| යෞවන සමාජ සඳහා ක්‍රීඩා උපකරණ මිළ දී ගැනීම | 2,039,730 | බෙදාහැරීම් විස්තර |
| ණයගැතියෝ | 20,842,770 | ශේෂ සනාථ කිරීම් |
| ණයහිමියෝ | 14,120,177 | ශේෂ සනාථ කිරීම් |

2.2.5 **නීති ,රීති ,රෙගුලාසි සහ කළමනාකරණ තීරණ වලට අනුකුල නොවීම**

-------------------------------------------------------------------------

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) පනත්

--------

1971 අංක 38 දරන මුදල් පනතේ 25 හා 26 වගන්ති පරිදි මහජනතාවගෙන් එකතු කරනු ලබන මුදල් විශේෂ අරමුදලක් යටතේ මහා භාණ්ඩාගාරයේ තැන්පත් කර එමගින් වැය දැරීම් කළ යුතු වුව ත් , ඊට පටහැනි ව මුරුක්කණ්ඩි ටෙම්පල් දුම්රිය ස්ථානය ඉදිකිරීම වෙනුවෙන් මහජනයාගෙන් එකතු කර ගත් රු. 2,417,132 ක් වූ මුදල සභාවේ බැංකු ගිණුමක තැන්පත් කර තිබුණි. මේ සඳහා භාණ්ඩාගාර අනුමැතිය හෝ ලබා නොතිබුණි.

(ආ) ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහය

--------------------------------------

2.14, 5.4.4, 5.4.10 හා 8.9.1, ඡේදවල ට පටහැනි ව පිළිවෙලින් අවස්ථා 04 ක දී මිළ කැඳවීමකින් තොර ව රු. 2,943,251ක් ද, ඇප සුරක්ෂණයක් රහිතව රු. 495,000 ක අත්තිකාරමක් ද, කාර්යසාධන සුරක්ෂණයක් රහිතව රු.2,475,000 ක් ද, කොන්ත්‍රාත් ගිවිසුමක් රහිත ව රු.1,861,000 ක් ද ගෙවා තිබුණි.

( ඇ) වක්‍රලේඛ

----------

(i) සභාවේ අධ්‍යක්ෂ (පාලන) තනතුරේ වැඩ බැලීම ට රේඛීය අමාත්‍යාංශයේ ජ්‍යෙෂ්ඨ සහකාර ලේකම් (පරිපාලන) පත් කර තිබුණි. අංක 13 / 2008 හා 2008 ජූනි 26 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයේ 05 වැනි ඡේදයට පටහැනිව නිත්‍ය තනතුරට හිමි දීමනාවට අමතරව වැඩ බැලීමේ තනතුරට හිමි මාසික ඉන්ධන දීමනාව වු රු. 17,250 ද ලබා ගෙන තිබුණි.

(ii) ප්‍රතිපත්ති සම්පාදන හා ක්‍රියාත්මක කිරීමේ අමාත්‍යාංශ ලේකම්ගේ අංක MPDI / MPRD / Veh හා 2002 සැප්තැම්බර් 11 දිනැති චක්‍රලේඛය පරිදි ලියාපදිංචි ආයතනයක් වෙතින් කුලි පදනම මත වාහන ලබා ගැනිම වෙනුවට ප්‍රසම්පාදන ක්‍රියාවලියෙන් ද බැහැර ව හා කයිඳු සේවා ගිවිසුමක් ද රහිතව එක් පුද්ගලික ආයතනයකින් එම සේවාව ලබා ගෙන 2010 වර්ෂය තුල දී පමණක් ප්‍රවාහන කුලී ලෙස රු. 476,798 ක් ගෙවා තිබුණි.

(ඈ) බඳවා ගැනීමේ පරිපාටිය

---------------------------

සභාවේ අනුමත බඳවා ගැනීමේ පරිපාටියට අනුව අධ්‍යක්ෂ තනතුර සඳහා තිබිය යුතු මූලික සුදුසුකම් සපුරා නොතිබුණු නිලධාරියෙකු ද්විතීයන පදනම මත අධ්‍යක්ෂ (සංවර්ධන ) තනතුරට පත් කර තිබුණි. 1979 අංක 69 දරන ජාතික තරුණ සේවා පනතේ 06 වැනි වගන්තිය යටතේ ගරු අමාත්‍යතුමාට ඇති බලතල ප්‍රකාරව ලබා දී ඇති විධානයන්ට අනුකුල වන පරිදි ජාතික තරුණ සේවා සභාවේ සභාපති/ අධ්‍යක්ෂ ජනරාල් විසින් මෙම බඳවා ගැනීම සිදුකර ඇති බව ඔහු විසින් 2011 මැයි 31 දිනැතිව අප වෙත දන්වා එවා තිබුණි.

## 3. මූල්‍ය සහ මෙහෙයුම් සමාලෝචනය

------------------------------------

### 3.1 මූල්‍ය සමාලෝචනය

--------------------

#### 3.1.1 මූල්‍ය ප්‍රතිඵලය

---------------

සමාලෝචිත වර්ෂය තුල සභාවේ මෙහෙයුම් ප්‍රතිඵලය රු.මිලියන100.68 ක ඌනතාවක් වූ අතර ඊට අනුරූපව ඉකුත් වර්ෂයේ ඌනතාවය රු.මිලියන 73.40 ක් වූයෙන් සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රතිඵලය රු.මිලියන 27.28 ක පිරිහීමක් පෙන්නුම් කෙරිණ.

#### 3.1.2 මූල්‍ය ප්‍රතිඵල විග්‍රහය

---------------------

පහත සඳහන් නිරීක්ෂණයන් කෙරේ

තරුණ සංවර්ධන වියදම් රු. මිලියන 70.11 කින් අඩු වී තිබීමත්, අභ්‍යන්තර ඉපයීම් රු. මිලියන 21.31 කින් වැඩි වී තිබීමත් නිසා හිතකර විචලනයක් ඇති වී තිබුණු නමුත් පුනරාවර්තන වියදම් සඳහා ලැබුණු රජයේ දායකය හා පුනරාවර්තන වියදම් සඳහා වූ අමාත්‍යාංශ හා රාජ්‍ය ආයතන වෙතින් ලද බාහිර දායක පිළිවෙලින් රු.මිලියන 8.60 ක් හා රු. මිලියන 54.96 කින් අඩු වී තිබීමත් , වර්ෂය තුල පාරිතෝෂික දීමනා වියදම රු.මිලියන 54.92 කින් වැඩි වී තිබීමත් මෙම මල්‍ය ප්‍රතිඵලයේ පිරිහීමට හේතු වී තිබුණි.

#### 3.1.3 මතභේදයට තුඩුදෙන ගනුදෙනු

-------------------------------

පහත සඳහන් නිරීක්ෂණයන් කෙරේ.

(අ) ගම්පහ දිස්ත්‍රික් කාර්යාලයේ අධීක්ෂණය යටතේ 2002 වර්ෂයේ ආරම්භ කළ සංගීත සංචිතය 2004 වසරේ සිට අක්‍රීය වී තිබුණු අතර එම සංචිතය සඳහා සභාව විසින් ලබා දුන් රු. 855,118 ක සංගීත භාණ්ඩ ආපසු සභාව වෙත භාර නො දී උඩුගම්පොළ ප්‍රදේශයේ තරුණ මධ්‍යස්ථානයකට ගෙන ගොස් තිබුණි.

(ආ) ජාතික තරුණ සේවා සභාව යටතට නොගැනෙන ස්වාධීන ආයතනයක් වූ යෞවන තිළිණ අධිකාරයේ පූර්ණකාලීනව සේවයේ නියුතු වු විධායක ලේකම්වරයාට යෞවන තිළිණ අධිකාරයේ විෂයපථයට අදාල වන 10 වැනි ජාත්‍යන්තර තිළිණ සම්මේලනයට සහභාගි වීමට විදේශ ගත වීම වෙනුවෙන් රු. 21,902 ක් ද , රේඩියෝ අමාත්‍යංශයට අනුයුක්තව සේවය කරන කැමරා ශිල්පීයෙකු සඳහා ඉන්දියාවේ පැවැත්වුණු පුහුණු පාඨමාලාවක් වෙනුවෙන රු. 45,000 ක් ද සභා අරමුදලෙන් ගෙවා තිබුණි.

3.1.4 **අවිධිමත් ගණුදෙනු**

----------------------

යෞවන සමාජ අතරේ බෙදා හැරීම සඳහා කැරම් බෝඩ් 945 ක් රු. 1,370,250 ක ට මිළ දී ගෙන තිබුණු නමුත් ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 8.9.1 (ආ) උප පේදය පරිදි විධිමත් ලිඛිත කොන්ත්‍රාත් ගිවිසුමක් අත්සන් කර නොතිබුණි. ගබඩා භාරකරු විසින් එම භාණ්ඩ නිසි පරිදි භාරගත් බවට තහවුරුවක් හා බෙදා දුන් යෞවන සමාජවල නාමලේඛණයන් ද ඉදිරිපත් නොවීණි.

3.2 **මෙහෙයුම් සමාලෝචනය**

------------------------------

3.2.1 **කාර්යසාධනය**

------------------

පහත සඳහන් නිරීක්ෂණයන් කෙරේ.

(අ) තරුණ සංවර්ධන වැඩසටහන යටතේ ක්‍රියාකාර සැලසුමට ඇතුළත් ව තිබුණු ඇස්තමේන්තු වටිනාකම රු. 44,578,150 ක ව්‍යාපෘති 04 ක් ක්‍රියාත්මක කර නොතිබුණු අතර ක්‍රියාකාර සැලැසුමට ඇතුලත් ව නොතිබුණු ව්‍යාපෘති 03 ක් සමාලෝචිත වර්ෂය තුල පවත්වා ඒ සඳහා රු. 33,797,606 ක් වැය කර තිබුණි.

(ආ) පුරෝගාමී තරුණයා වැඩසටහන

--------------------------------------

2006 වර්ෂයේ දී තරුණ සංවර්ධන තෙ දින වැඩමුළු 14 ක් පවත්වා එ මගින් තෝරා ගත් තරුණයින් 3160 දෙනෙකු ට 2008 වර්ෂයේ දි නැවත තෙ දින නේවාසික පුහුණුවක් ලබා දී මෙන් අනතුරු ව තරුණ සංවර්ධන වැඩසටහන් 06 ක් සම්බන්ධීකරණය කිරීම සඳහා ඔවුන් ට පැවැරුමක් ලබා දී තිබුණි. එය ඇගැයීම සඳහා සහතික පත් ප්‍රදානය කිරීමේ යෝජනාවක් හැර මෙම තරුණ තරුණියන් වෙනුවෙන් ගත් වෙනත් ඉදිරි ක්‍රියාමාර්ග කිසිවක් නොතිබුණි. වැඩසටහනේ සමස්ත වැය කිරීම රු. 17,691,863 ක් වූ අතර වෙනත් වියදම් ලෙස දක්වා තිබුණු රු. 2,788,678 ක් විගණනයේ දී පැහැදිලි කර ගත නොහැකි විය. සභාවේ තරුණ සංවිධාන හා සංවර්ධන අංශය විසින් මෙම වැඩසටහන සම්බන්ධයෙන් පසු විපරම් කටයුතු කර නොතිබුණි. මෙම වැඩසටහන මගින් ජාතික සංවර්ධන ක්‍රියාවලියෙ හි පුළුල් ග්‍රාමීය දායකත්වයක් බිහි කිරීමේ අරමුණ ඉටු වී නො තිබුණි.

(ඇ) යෞවන සමාජ ව්‍යවස්ථාවට අනුව එක් ග්‍රාම සේවා වසමක ට එක් යෞවන සමාජය බැගින් පිහිටුවිය යුතු නමුත් දිවයිනේ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස 332 ක් තුල ව්‍යාප්ත ග්‍රාම සේවා වසම් 14013 කට සාපේක්ෂව පිහිටුවා තිබුණු මුළු යෞවන සමාජ ගණන 9307 ක් විය.යෞවන සමාජ ස්වේච්ඡා සංවිධානයක් බැවින් එය ඒ ඒ ප්‍රදේශවල අවශ්‍යතාව මත ඔවුන්ගේ ඉදිරිපත් වීම අනුව පිහිටුවිය හැකි සංවිධානයක් බව සභාපති විසින් දන්වා ඇත.

(ඈ) හෙයියන්තුඩුව පුහුණු මධ්‍යස්ථානය තුල පැවැත් වූ පාඨමාලා සියල්ල 2002 වර්ෂයෙන් පසු නතර කර දමා තිබුණු අතර නැවත ආරම්භ කිරීම ට මෙම වාර්තාවේ දිනය දක්වාම පියවර ගෙන නොතිබුණි.

### 3.2.2 පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභාවේ නියෝග ක්‍රියාත්මක නොකිරීම

(අ) උඩුදුම්බර ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ සේවයේ නියුතු ව සිටි තරුණ සේවා නිලධාරී එම කාර්යාලයේ ලිපි ශීර්ෂවල සිය නිලනාමය භාවිතා කරමින් උඩුදුම්බර ප්‍රදේශයේ තරුණ තරුණියන්ගේ ආර්ථික සංවර්ධනය උදෙසා යැ යි ව්‍යාජ තොරතුරු දක්වමින් ශ්‍රී ලංකා හදබිම අධිකාරිය යටතේ පවතින කොත්මලේ ගොවි පුහුණු මධ්‍යස්ථානයේන් කිරි ගවයින් 16 දෙනෙකු 2009 පෙබරවාරි 25 දින රු. 160,000 ක සහන මිළක ට ලබා ගෙන මෙම සියළු සතුන් මස් කර විකුණා තිබුණි. මේ සම්බන්ධයෙන් ඉහත නිලධාරියාට හා ඒ හා සම්බන්ධ අනෙකුත් නිලධාරීන් ට එරෙහිව නීතිමය පියවර ගෙන මාසයක් ඇතුළත වාර්තා කළ යුතු බවට , 2010 නොවැම්බර් 03 දින රැස් වූ පාර්ලිමේන්තු පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභාව විසින් නියෝග කර තිබුණ ද අදාල නිලධාරියාගෙ වැඩ තහනම් කිරීමට 2011 ජනවාරි 31 තෙක් කල් ගත වී තිබුණි. ඒ හැර 2011 මාර්තු 28 දින වන විටත් කිසිදු විනය ක්‍රියාමාර්ගයක් ගෙන නොතිබුණි.

(ආ) ජාතික තරුණ සේවා සභාවට අනුබද්ධිත ආයතනයක් වූ සී/ස තරුණ සේවා සමාගමේ විගණිත ගිණුම් විගණකාධිපතිවරයාගේ පරීක්ෂාවට බදුන් විය යුතු බවට 2007 ජනවාරි 12 දින රැස් වූ පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභාව විසින් තීරණය කර තිබුණු නමුත් එම නියෝග ක්‍රියාත්මක වී නොතිබුණි.

### 3.2.3 කළමනාකරණ අකාර්යක්ෂමතා

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ

(අ) ජලය හා විදුලිය ද ඇතුළු ව සී / ස තරුණ සේවා සමාගම විසින් ප්‍රයෝජනයට ගන්නා සභාව සතු දේපල වෙනුවෙන් 2004 වර්ෂය තෙක් එම සමාගමින් අය විය යුතු රු. 2,076,734 ක් අංක 22/2006 දරන සභා තීරණය අනුව 2009 වර්ෂයේ දී ගිණුම්වලින් කපා හැර තිබුණු අතර 2005 වර්ෂයේ සිට ඉදිරියට සමාගමින් අයවිය යුතු රු.1,288,431 ක් වූ මුදල 2009 දෙසැම්බර් සිට 20% බැගින් පියවා ගැනීම ට උපදෙස් දී තිබුණි. ඒ අනුව 2010 දක්වා ඉන් රු.761,569 ක් පමණක් අය කර තිබුණි. නමුත් 2010 සැප්තැම්බර් 06 දිනැති අංක 18/2010 දරන සභා තීරණය මගින් මෙම 20% අයකිරීම ද අත්හිටවා තිබුණු අතර 2010 ජූනි 30 දිනට රු. 1,588,431 ක් තවදුරටත් සමාගමින් අයවීමට තිබුණි.

(ආ) ජාතික යෞවන සම්මාන උළෙල - 2009

------------------------------------------

පහත කරුණු නිරීක්ෂණය කෙරේ.

i) 2009 වර්ෂයේ ජාතික යෞවන සම්මාන උළෙල වෙනුවෙන් රු. 5 ,485,000 ක ප්‍රතිපාදනය වෙන් කර තිබුණු අතර තථ්‍ය වියදම රු. 8,336,403 ක් විය. ඒ අනුව රු. 2,851,403 ක ප්‍රතිපාදන ඉක්මවා වියදම් දරා තිබුණි.

ii) මු. රෙ. 177 (1) ප්‍රකාර ව ත්‍යාග මුදල් ප්‍රදානයෙන් පසු අත්තිකාරම් මුදලින් ඉතිරි මුදල් පසු දින බැංකු ගත කිරීම කළ යුතු වුවත් රු. 506,000 ක් දින 15 ක් අත රඳවා ගෙන පසුව බැංකු ගත කර තිබුණි.

iii) විවිධ තරඟවලින් ප්‍රථමස්ථානය ලැබූ 38 දෙනෙකුට සම්මාන උළෙලෙ පැවැති අවස්ථාවේ සහතික පත් ප්‍රදානය නොකර දිස්ත්‍රික් කාර්යාල මඟින් එම ප්‍රදානයන් ලබා දීමට තීරණය කර තිබුණි. නමුත් පසුව අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් මෙම ප්‍රදානයන් සිදු නොකිරීමට තීරණය කර තිබුණි.

iv) ජයග්‍රහකයින්ගේ නිර්මාණ ඇතුළත් ප්‍රකාශන දෙකක පිටපත් දෙදහසක් 2010 මාර්තු මස මුද්‍රණය කර තිබුණු නමුත් ඉන් රු. 182,873 ක පිටපත් 961 ක් 2010 ජූලි වන විටත් ගබඩාවේ ඉතිරි ව පැවතිණි.

v) එක් අවස්ථාවක දී පුවත්පත් දැන්වීමක් වෙනුවෙන් රු. 36,288 ක් වැය කරමින් අවස්ථා 04 ක දි කැඳවූ මිල ගණන් පිළිබඳ සැලකිලිමත් නොවී එම මිල ගණන් තුල ඉහළම මිළ ඉදිරිපත් කර තිබුණු ආයතනය වෙතින් එක් දිනක් තුල නැවැත මිල කැඳවීමක් කර ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 6.2.2 හා 2.14.1 උප වගන්තිවලට පටහැනිව කිරි ගරුඬ සම්මානය සකස් කිරීම සඳහා රු. 467,500 කට ප්‍රසම්පාදනය පිරිනමා තිබුණි.

vi) වේදිකා පසුතල නිර්මාණය සඳහා රු. 1,575,000 කට ප්‍රසම්පාදනය පිරිනමා තිබුණ ද ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 8.9.1 උප වගන්තිය පරිදි ඒ සඳහා ගිවිසුමකට එළැඹ නොතිබුණි.

(ඇ) සභාවේ නිලධාරීන් තිදෙනෙකු විසින් 1989/90 කාලය තුල ඉන්ධන ඇනවුම් අයථා ලෙස පරිහරණය කරමින් සිදු කළ වංචාවක් සම්බන්ධයෙන් 1990 පෙබරවාරි 01 දින සභාව විසින් අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුව ට යොමු කළ ලිඛිත පැමිණිල්ල පරිදි කොළඹ මහාධිකරණයේ අංක 9115/97 යටතේ නඩු පවරා 2008 ඔක්තෝබර් 24 දින ලබා දුන් තීන්දුව මත දඩ මුදල් ලෙස රු. 580,000 ක් ගරු අධිකරණය වෙත ගෙවා තිබුණි. කෙසේ වෙතත් වර්ෂ 22 ක් ගත වී තිබිය දී ත් මේ සම්බන්ධයෙන් සභාව ට සිදු වූ රු. 1,147,688 ක් වූ අලාභය අය කර ගැනීම ට සමාලෝචිත වර්ෂය දක්වාමත් විධිමත් පියවරක් ගෙන නොතිබුණි. මේ සඳහා සිවිල් අධිකරණයක නඩු පවරන ලෙස නීතිපතිවරයා විසින් දැනුම් දී තිබුණි.

(ඇ) සී/ස තරුණ සේවා සමාගමේ විගණන කටයුතු ජාතික තරුණ සේවා සභාවේ අභ්‍යන්තර විගණනය මගින් ද සිදු කළ යුතු බවට 2011 ජනවාරි 24 දිනැති ලිපියෙන් යෞවන කටයුතු හා නිපුණතා සංවර්ධන අමාත්‍යාංශ ලේකම් විසින් ජාතික තරුණ සේවා සභාවේ සභාපතිවරයා වෙත උපදෙස් දී තිබුණ ද 2011 මාර්තු 28 දින වන තුරුත් එම විගණන කටයුතු ආරම්භ කර නොතිබුණි.

3.2.4 **මෙහෙයුම් අකාර්යක්ෂමතා**

පහත සඳහන් නිරීක්ෂණයන් කෙරේ.

(අ) විදේශ ගමන් - දකුණු අප්‍රිකානු ලෝක තරුණ හා ශිෂ්‍ය සමුළුව

සභාව ට කිසිදු සම්බන්ධතාවක් නොමැති ස්වේච්ඡා සංවිධාන දෙකක සමාජිකයින් සිව් දෙනෙකු ට යාන පත්‍ර හා අනියම් දීමනා ලෙස රු. 214,631 ක් සභා අරමුදලින් ගෙවා තිබුණි. එමෙන්ම, යාන පත්‍ර හා ලියාපදිංචි ගාස්තු වෙනුවෙන් ඊට අදාල ආයතනය වෙත ගෙවීම් කිරීම වෙනුවට පෞද්ගලික සංවිධානයකට රු. 1,750,000 ක් ද ගෙවීමට සභාව පියවර ගෙන තිබුණි. කෙසේ වෙතත් මෙම මුදල් විදේශ කටයුතු අමාත්‍යාංශයෙන් ප්‍රතිපූරණය කරගෙන තිබුණි.

(ආ) හෙයියන්තුඩුව පුහුණු මධ්‍යස්ථානයේ ගෘහස්ථ ක්‍රීඩාංගණය නවීකරණය නිසි පරිදි ඉටු නොවීම නිසා ගෙවීම් අත්හිටුවා තිබුණු අතර 2010 වර්ෂය අවසාන වන විට වැඩ නිම කිරීම ට ඉඩ දුන් කාලය ද ඉක්මවා වර්ෂ 02 ක් ගත වී තිබුණි. නමුත් මේ සම්බන්ධයෙන් කිසිදු පියවරක් ගෙන නොතිබුණු අතර අවසන් ගිණුම්වල තවදුරටත් කෙරිගෙන යන වැඩ ලෙස රු. 2,432,464 ක් දක්වා තිබුණි.

3.2.5 **ආර්ථික නොවූ ගණුදෙනු**

පහත සඳහන් නිරීක්ෂණයන් කෙරේ.

(අ) සී/ස තරුණ සේවා සමාගම , සී/ස තරුණ සේවා (සංගීත) සමාගම හා සී/ස තරුණ සේවා (නැටුම්) සමාගමේ කොටස් ආයෝජනය වෙනුවෙන් රු. 4,032,360 ක් වර්ෂ 1985 සිට 1990 දක්වා කාලය තුල වැය කර තිබුණි. මෙම ආයෝජන වෙනුවෙන් කිසිදු ප්‍රතිලාභයක් 2010 වර්ෂය දක්වාමත් ලැබී නොතිබුණු අතර සී/ස තරුණ සේවා (සංගීත) සමාගම හා සී/ස තරුණ සේවා (නැටුම්) සමාගම කිසිදු ක්‍රියාකාරීත්වයක් නොමැති නාමික ස්වරූපයේ ආයතන විය.

(ආ) පානදුර, මහරගම හා අනුරාධපුර යොවුන් සරසවි ඉදිකිරීම සඳහා මූලික පිඹුරුපත් සැකසීම වෙනුවෙන් 2007 වර්ෂය තුල දී රු. 575,000 ක් ගෙවා තිබුණු නමුත් 2010 වර්ෂය අවසානය වනතුරුත් එම ඉදිකිරීම් ආරම්භ කිරීමට හෝ පියවර ගෙන නොතිබුණි.

(ඇ) සභාව ට අදාල නොවූ යෞවන තිළිණ අධිකාරියේ විෂය පථයට අයත් ස්වර්ණ තිළිණ ප්‍රදානෝත්සවය වෙනවෙන් රු.100,000 ක් එම අධිකාරිය ට ගෙවා තිබුණු නමුත් සියලු කටයුතු සූදානම් කළ පසු උත්සවය කල් දැමූ හෙයින් පවත්වා නොතිබුණි.

(ඇ) 2010 වර්ෂය තුල ක්‍රියාත්මක වූ යොවුන් වැඩසටහන් 04 ක ප්‍රචාරන හා දැන්වීම් වෙනුවෙන් පමණත් රු. 9,502,289 ක් වැය කර තිබූ අතර එය, එම වැඩසටහන්වල සමස්ත වියදමින් 23% ක් විය.

### 3.2.6 ඌන උපයෝජිත වත්කම්

---------------------------

පහත නිරීක්ෂණය කරනු ලැබේ.

බේරුවල තරුණ මධ්‍යස්ථානය ඉදිකිරීම සඳහා 2000 ජූලි 07 දින සිට බල පැවැත්වෙන පරිදි අවුරුදු 50 ක බදු කාල සීමාවකට නාගරික සංවර්ධන අධිකාරියෙන් රු. 3,330,000 ක ට ඉඩමක් බදු ගෙන තිබුණු අතර 2008 දෙසැම්බර් 31 දින වන විට ඉඩම සඳහා දරා ඇති මුළු වියදම රු. 3,374,330 ක් විය. මිළ දී ගෙන අවුරුදු 10 ක කාලයක් ගත වී ඇති නමුත් සමාලෝචිත වර්ෂය අවසාන වන විට ද කිසිම සංවර්ධන කටයුත්තක් ආරම්භ කර නො තිබුණි.

### 3.2.7 ගොවිපොලවල් පවත්වාගෙන යැමෙන් සිදු වූ පාඩු

- ---------------------------------------------------

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ

(අ) අක්කර 08ක පමණ වපසරියක් සහිත හෙයියන්තුඩුව ගොවිපොළ තුල සිදු කර තිබුණු පොල් වගාව හැරුණු කොට විධිමත් පරිදි සිදු කළ වෙනත් කිසිඳු කෘෂි භෝග වගාවක් හෝ සත්ත්ව පාලනයක් දක්නට නොතිබුණි. 2010 වර්ෂය සඳහා ගොවිපොළෙන් ලද ශුද්ධ අලාභය රු. 236,362 කි. කෙසේ නමුත් 2010 වර්ෂය සඳහා වූ අවසාන ගිණුම මගින් ගොවිපොලේ ශුද්ධ ලාභය රු. 331,667 ක් ලෙස සාවද්‍ය ව දක්වා තිබුණි.

(ආ) සභාව විසින් පවත්වාගෙන යන ගොවිපොළවල් 03 කින් 2010 වර්ෂය සඳහා රු. 248,551 ක අලාභයක් ඇති වී තිබුණි.

3.2.8 **සාවද්‍ය ගෙවීම්**

----------------

පහත නිරීක්ෂණය කරනු ලැබේ.

හෙයියන්තුඩුව ජාතික වොලි බෝල් පුහුණු සංකීර්ණයේ ක්‍රීඩික ක්‍රීඩිකාවන් සඳහා ආහාර සැපයීම වෙනුවෙන් 2010 වර්ෂය තුල එක් වෙළඳ සැලකින් මිළ දී ගත් එළවළු වෙනුවෙන් ගෙවා තිබුණු ලෙස දක්වා තිබූ මුදල හා එම වෙළඳසැලින් ලබා ගත් සනාථ කිරීම් අනුව තථ්‍ය ලෙස මිළ දී ගෙන තිබුණු එළවළුවල වටිනාකම සැසඳීමේ දී රු. 252,002 ක මුදලක් සාවද්‍ය ලෙස වැඩිපුර ලබා ගෙන තිබුණි.

3.2.9 **වෙනත් රාජ්‍ය ආයතන වෙත ලබාදුන් සභාවේ සම්පත්**

----------------------------------------------------------------

පහත නිරීක්ෂණය කරනු ලැබේ.

සභාවේ පත්වීම් ලද නිලධාරීන් 22 දෙනෙකු වෙනත් අමාත්‍යාශ 05 ක් වෙත අනුයුක්ත කර තිබුණු අතර ඉන් රේබීය අමාත්‍යාංශය වෙත අනුයුක්ත කළ නිලධාරීන් 12 දෙනාගේ 2010 වර්ෂය සඳහා වූ රු.3,644,994 ක වැටුප් සභාව විසින් ගෙවා තිබුණි. නමුත් එම මුදල් අදාල රේබීය අමාත්‍යාශය වෙතින් ප්‍රතිපූරණය කර ගැනීම ට කටයුතු කර නොතිබුණි.

3.2.10 **වාහන උපයෝජනය**

----------------------

පහත කරුණු නිරීක්ෂණය කෙරේ

(අ) වාහන 14 ක මයිලෝ මීටර් වර්ෂයකට අධික කාලයක සිට අක්‍රිය ව පැවැතිය ද මු. රෙ. 1653 පරිදි කටයුතු කිරීමට පියවර ගෙන නොතිබුණි.

(ආ) සභාව විසින් පරිහරණය කරනු ලබන වර්ෂ 1985 සිට 1988 දක්වා කාලය තුල දී ලද වාහන 21 ක අයිතිය මිළ දී ගත් වර්ෂයේ සිට වෙනත් රාජ්‍ය ආයතන සතුව පැවැති අතර එම අයිතිය සභාව වෙත පවරා ගැනීම ට කටයුතු කර නොතිබුණි. එමෙන්ම මෙම වාහනවල පිරිවැය හා මිළ දී ගැනීම සඳහා අරමුදල් යෙද ව ආයතනය ද අවිනිශ්චිත වී තිබුණි.

(ඇ) ක්‍රීඩා හා යෞවන කටයුතු අමාත්‍යාංශය නමින් ලියාපදිංචි කර තිබුණු වර්තමානයේ යෞවන කටයුතු හා නිපුණතා සංවර්ධන අමාත්‍යාංශය සතු අංක 50-2592 දරන වාහනය එම අමාත්‍යාංශයේ අනුදැනුමින් තොර ව රු. 265,000 කට විකුණා තිබුණි.

3.2.11 **සංයුක්ත සැලැස්ම**

----------------------

පහත නිරීක්ෂණය කරනු ලැබේ

2010 - 2014 කාල සීමාවට සකස් කල සංයුක්ත සැලසුමෙහි , 2003 ජුනි 12 දිනැති පීඊඩී 12 රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයට අනුව පූර්ව තෙ වර්ෂයෙහි මූල්‍ය ප්‍රතිඵල මෙන්ම , මුදුන් පමුණුවාගත යුතු ඉලක්කයන්හි මූල්‍යමය අගයන් දක්වා නොතිබුණි. මේ නිසා වාර්ෂික ප්‍රගතිය මූල්‍යමය වශයෙන් ඇගයීමට නොහැකි විය.

3.2.12 **විගණන හා කළමනාකරණ කමිටු රැස්වීම් පැවැත්වීම සහ තීරණ ක්‍රියාත්මක කිරීම**

----------------------------------------------------------------------------------------------

විගණන හා කළමනාකරණ කමිටු රැස්වීමේ දී ගත් පහත සඳහන් තීරණ ක්‍රියාත්මක නොවූ අවස්ථා විය.

(අ) විගණන හා කලමනාකරණ කමිටුවට 2009 වර්ෂයේ සිට රේඛීය අමාත්‍යාංශයේ නියෝජිතයකු පත්කිරීම

(ආ) හානි හා පාඩු ලේඛනය ක්‍රමවත්ව නඩත්තු කිරීම

(ඇ) ක්‍රීඩා පිටි 4000 වැඩසටහන යටතේ මිලදී ගෙන තිබූ වොලිබෝල් කණු බෙදා අවසන් කිරීම

(ඈ) වාහන 27 ක් සභාව වෙත පවරා ගැනීමට කටයුතු කිරීම

(ඉ) වර්ෂ ගණනාවක සිට ඉදිරිය ට ගෙන යමින් පවතින ලැබියයුතු ගිණුම් කපා හැරීම සම්බන්ධව භාණ්ඩාගාර අනුමැතිය ලබා ගැනීම

(ඊ) කල් ගතවූ කොන්ත්‍රාත් අත්තිකාරම් රු.833,202 ක ට අදාලව පූර්ණ වාර්තාවක් ඉදිරිපත් කිරීම

(එ) කිසිදු සංවර්ධන කාර්යයකට යොදවාගෙන නොමැති බේරුවල ඉඩම සඳහා ව්‍යාපෘති යෝජනා ඉදිරිපත් කිරීම

3.2.13 **අයවැය ලේඛනමය පාලනය**

----------------------------------

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ

(අ) භාණ්ඩාගාර ප්‍රතිපාදන , අමාත්‍යාංශ හා රාජ්‍ය ආයතන ලැබීම් සහ අභ්‍යන්තර ඉපැයීම් යන අරමුදල් සැපයෙන ප්‍රභවයන් සියල්ල ඒකාබද්ධ කර සමස්ථ අයවැය ලේඛණයක් ඉදිරිපත් කර නොතිබුණි.

(ආ) 2010 වර්ෂයේ මුල් වැය ඇස්තමේන්තුව රු. මිලියන 45.41 කින් වැඩි වන පරිදි සමාලෝචිත වර්ෂය තුල දී කිහිප විටක් සංශෝධනය කර තිබුණු නමුත් වර්ෂයේ වියදම එම සංශෝධිත අගයටත් වඩා රු. මිලියන 6.85 කින් වැඩි වී තිබුණි.

(ඇ) ඒ අනුව වර්ෂය ආරම්භයේ අනුමත කරන ලද අයවැය ඇස්තමේන්තුව ඵලදායී මූල්‍ය පාලන කාරකයක් ලෙස යොදාගෙන නොතිබූ බව නිරීක්ෂණය විය.

4. **පද්ධති හා පාලනය**

------------------------

විගණනයේදී නිරීක්ෂණය වූ අඩුපාඩු වරින් වර සභාවේ සභාපති වරයාගේ අවධානයට යොමු කරන ලදී . පහත සඳහන් පද්ධති හා පාලන ක්ෂේත්‍රයන් සම්බන්ධයෙන් විශේෂ අවධානය යොමු කල යුතු වේ.

(අ) කෘෂිකාර්මික කටයුතු
(ආ) ලැබිය යුතු ගිණුම්
(ඇ) බඳවාගැනීම් හා අනුයුක්ත කිරීම්
(ඈ) ඉන්ධන දීමනා
(ඉ) වාහන
(ඉ) තරුණ සංවර්ධන වැඩසටහන් පැවැත්වීම
(ඊ) ප්‍රසම්පාදන මාර්ගෝපදේශ
(උ) විදේශ ගමන්
(ඌ) ආයෝජන